වලිකාමම් උතුර ප්‍රාදේශීය සභාව
යාපනය දිස්ත්‍රික්කය
----------------------

1 මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
--------------------------------

2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 22 දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 29 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, 2016 වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 ජූලි 17 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට වලිකාමම් උතුර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-----------------------------------------

1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති
-------------------------

සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අනුගමනය කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව්කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු
---------------------------

පළාත් පාලන සේවයේ නිලධාරින්ගේ විශ්‍රාම වැටුප් සහ විශ්‍රාම ප්‍රතිලාභ වෙනුවෙන් ගෙවිය යුතු රු. 2,876,771 ක් සඳහා විශ්‍රාම වැටුප් වෙන් කිරීම් කර නොතිබුණි.

1.3.3 ලේඛන හා පොත්පත් නොපැවැත්වීම
------------------------------------------------

සභාව විසින් හානි පාඩු ලේඛනය,මිණුම් පත්‍ර ලේඛනය,ඉඩම් විකුණුම් ලේඛනය යනාදී ලේඛන පවත්වා නොතිබුණි.

1.3.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම
---------------------------------------------

පහත දැක්වෙන අනුකූල නොවූ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති, රීති සහ රෙගුලාසිවලට යොමුව | | | අනුකූල නොවීම |
|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | | |
| | (i) | පරිච්ඡේදයේ V වගන්තිය 148(1) | වාහන සහ සතුන් වෙනුවෙන් බදු පනවීමට ප්‍රදේශීය සභාවට බලය පවරා තිබුණද, එම වාහන සහ සතුන් සඳහා නියමිත බදු ප්‍රතිශතයක් අයකර නොතිබුණි. |
| | (ii) | පරිච්ඡේදයේ V | රු. 628,007 ක හිඟ වරිපනම් බදු මුදල් ගෙවීම පැහැර හැර තිබූ අයට එරෙහිව ලේකම් විසින් වරෙන්තු ලියා නොතිබුණි. |

| | | |
|---|---|---|
| | වගන්තිය 158(1) | |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 571 | රු. 5,165,225 ක කල් ඉකුත්වූ තැන්පත් සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | 1990 ඔක්තෝබර් 10 වන දිනැති අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ චක්‍රලේඛය | සභාව සතු වාහනවල ඉන්ධන පාරිභෝජනය පිළිබද පරීක්ෂණ පවත්වා නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය
-----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵලය
-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලය පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු. 28,623,466 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු. 19,755,761 ක් විය. මෙය සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු. 8,867,705 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය
-------------------------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ සභාවේ මූල්‍ය ප්‍රතිඵලය ශුද්ධ අතිරික්තය රු. 72,887 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ශුද්ධ අතිරික්තය රු. 9,168 ක් විය. මෙය සමාලෝචිත වර්ෂයේ අවසාන මූල්‍ය ප්‍රතිඵලය රු. 63,719 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණ.

2.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය
--------------------------------------

ඉදිරිපත්කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සභාවේ සමාලෝචිත වර්ෂයේ කාරක ප්‍රාග්ධනය රු. 108,653,018 ක් වී තිබූ අතර, එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ කාරක ප්‍රාග්ධනය රු. 83,913,762 ක් වී තිබුණි. මේ අනුව සමාලෝචිත වර්ෂයේ කාරක ප්‍රාග්ධනයේ රු. 24,739,256 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි.

2.4 ආදායම් පරිපාලනය
------------------------

2.4.1 ආදායම් රැස්කිරීමේ කාර්‍යසාධනය
--------------------------------------

කොමසාරිස් විසින් ඉදිරිපත් කර තිබූ පරිදි සමාලෝචිත වර්ෂය සඳහා ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | 2016 | | |
|---|---|---|---|
| | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
| | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | 101 | 100 | 628 |
| බදු කුලී | 3,027 | 5,519 | 70 |
| බලපත්‍ර ගාස්තු | 1,665 | 1,316 | - |
| වෙනත් ආදායම් | 90,711 | 86,144 | 75,255 |
| එකතුව | 95,504 | 93,079 | 75,953 |

2.4.2 වරිපනම් බදු

රු. 628,007 ක අයවිය යුතු වරිපනම් බදු අයකර ගෙන නොතිබුණි.

2.4.3 උසාවි දඩ මුදල් සහ මුද්දර ගාස්තු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රු. 441,098 ක් අයවිය යුතු උසාවි දඩ මුදල් මෙතෙක් අයකර ගෙන නොතිබුණි.

(ආ) ඉඩම් රෙජිස්ටාර් ජනරාල්වරයාගෙන් අයවියයුතු රු. 63,903,300 ක් මුද්දර ගාස්තු අයකර ගෙන නොතිබුණි.

3 මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සභාවේ අනුමත සේවක සංඛ්‍යාව 125 ක් වූවද, තත්‍ය සේවක සංඛ්‍යාව 117 කි. ඒ අනුව සේවකයන් 09 ක පුරප්පාඩුද 01 සේවක තනතුරක් අතිරික්තවද තිබුණි.

(ආ) (i) විනාශ කළයුතු පුස්තකාල පොත් විනාශ කර නොතිබුණි.

(ii) කාර්යාලයේ සිදුවූ ගින්නෙන් සිදුවූ විනාශය සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

(ඇ) වාර්ෂිකව විගණන කළමනාකරණ කමිටු රැස්වීම 04 ක් පැවැත්විය යුතුය. එසේ වූවද, සභාවේ සමාලෝචිත වර්ෂයේ විගණන කළමනාකරණ කමිටු රැස්වීම් 02 ක් පමණක් පවත්වා තිබුණි.

3.2 ඌන උපයෝජිත වත්කම්

සභාවට අයත් නොවන ඉඩමක ළමා උද්‍යානයක් ඉදිකර තිබීම නිසා එය ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

3.3 අපද්‍රව්‍ය කළමනාකරණ

අපද්‍රව්‍ය වර්ගීකරණය කිරීමකින් තොරව ගොඩ ගසා තිබුණි.

4 ගිණුම් කටයුතු භාවය හා යහපාලනය
----------------------------------------
අයවැය පාලනය
-----------------
වියදම් ව්‍යුහය
---------------
අයවැයගත වියදම් සහ තත්‍ය වියදම් අතර රු. 204 සිට රු. 14,168,216 දක්වා වියදම් විචලනයක් පැවතුනු බව විගණනයේදී නිරික්ෂණය විය.